# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පහත පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර - 1. කළමනාකරු නීති**

**2. අභ්‍යන්තර විගණක**

**සුදුසුකම් - 1. කළමනාකරු නීති**

**(a) බාහිර අයදුම්කරුවන්**

**නීතිඥවරයෙකු වීම**

සහ

නීතිඥවරයෙක් ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව නෛතික ක්ෂේත්‍රයේ අවම වසර තුනක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සමග කම්කරු නීතිය සහ නෛතික කටයුතු හැසිරවීම පිළිබඳව මනා දැනුමක් සහිත වීම.

**(b) අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය කෙරෙන සුදුසුකම් ලබා තිබීම.

**2. අභ්‍යන්තර විගණක**

(a) බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ගණකාධිකරණය / මූල්‍ය කළමනාකරණය / කළමනාකරණය / වාණිජ්‍ය පිළිබඳ මූලික උපාධියක්

   සහ

   මූලික උපාධිය ලබාගැනීමෙන් අනතුරුව තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර තුනක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද
2. තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත්වීම

   සහ

   තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර තුනක සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද
3. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමත්වීම

   සහ

   තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර තුනක සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් (ඉහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය කෙරෙන සුදුසුකම් ලබා තිබීම
2. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයක කනිෂ්ඨ කළමනාකාර (JM) වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවයක් සපුරා තිබීම

**වැටුප් පරිමාණය** : 2016/02 කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි ඉහත තනතුර සඳහා MM 1-1-2016 රු. 53,175-10 x 1,375-15 x 1,910 - 95,575 වැටුප් පරිමාණය අදාළ වේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** : පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගැනේ.

- අදාළ පළපුරුද්ද - ලකුණු 30
- අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 30
- අනෙකුත් ජයග්‍රහණ - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය - ලකුණු 25

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට උපරිම වයස් සීමාව බලනොපායි.

**අනෙකුත්** : මෙම වර්ගීකරණය සඳහා වන සියලු බඳවාගැනීම් මෙම බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

**අමතර ප්‍රතිලාභ** : නේවාසික හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය.

සේවක අර්ථසාධක අරමුදලට හෝ වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතියට ඔබගේ වැටුපෙන් අවම වශයෙන් 10% ක දායකත්වය සමග එබඳු අර්ථසාධක අරමුදලක් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ දායකත්වය උපරිම 12% ක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ඔබගේ වැටුපෙන් 3% ක්.

**අයදුම් කිරීම** : අයදුම්කරුවන් තම අයදුම්පත් සියලු විස්තර සහ උප්පැන්න සහතිකය, අධ්‍යාපනික සහතික සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රජයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් නිර්දේශ සමග අදාළ ආයතන ප්‍රධානින් මගින් එවිය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** : 2021.04.30 වන දින හෝ ඉන් පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැළැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**නො. 21, BCC පරිශ්‍රය,**
**මීරානියා වීදිය, කොළඹ 12.**